# ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා රජයේ පාසල්වල ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම හා භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

(ගලෙන්බිඳුණු වැව අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින්)


ඕමත්තගේ සුභානි සේනාරත්න

B.Ed (කොළඹ)


අධ්‍යාපනපති උපාධි වැඩසටහන සඳහා ඉදිරිපත් කරන නිබන්ධය


විවෘත විශ්ව විද්‍යාලය

අධ්‍යාපන පීඨය

ලි.ප.අ. 409080721


2009/2010

2013 දෙසැම්බර්


OPEN UNIVERSITY

70886

70886

# සංක්ෂිප්තය

මෙම අධ්‍යයනය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා රජයේ පාසල් වල ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම හා භාවිත වන ආකාරය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් කිරීමට දියත් කරන ලදි. 2002 වසරේ සිට ක්‍රියාත්මක දෙවන සාමාන්‍ය අධ්‍යාපනික නවීකරණ ව්‍යපෘතිය (SEMP) යටතේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් භාවිතය හඳුන්වා දෙන ලදි. ගුණාත්මක යෙදවුම් පාසල්වලට ලබාදීමේ පරමාර්ථය වනුයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් තක්සේරු කිරීම හා එම සම්පත් සෑම සිසුවෙකුට ම සාධාරණ ලෙස බෙදා හැරීමයි. මෙසේ පාසල්වලට දැනට දශකයක් පමණ කාලයක් තුළ හඳුන්වා දෙනු ලැබූ ගුණාත්මක යෙදවුම් නිසි ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිතයට ගැනේ ද යන්න විමර්ශණාත්මකව විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

මෙම අධ්‍යයනය පාසල් වර්ග හතරම ආවරණය වන සේ ගලෙන්බිඳුණු වැව අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් අටක් නියැදිය ලෙස තෝරා ගෙන සිදු කළ අතර සම්මුඛ සාකච්ජා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ හා ලිඛිත මූලාශ්‍ර ඇසුරින් තොරතුරු සපයා ගැනීම සිදු කෙරිණි. මෙහිදී ගුණාත්මක යෙදවුම් පාසල්වලට හඳුන්වා දීමේ අරමුණු හඳුනා ගැනීමටත්, ඒ ආශ්‍රිත ක්‍රියාවලිය පාසල් පද්ධතිය තුළ සිදු වන ආකාරයත් දැන ගැනීමට හැකියාව ලැබුණි. තවද ක්‍රියාත්මක තත්වය තුළ දී මේ ආශ්‍රිතව විදුහල්පති ප්‍රමුඛ ගුරු මණ්ඩලය මුහුණ දෙන ගැටළු හා ඒ ඒ පාසල් වර්ගය අනුව එම ගැටළු විවිධ වන ආකාරය පිළිබඳ තොරතුරු රැසක් රැස් කරගැනීමට මෙමගින් හැකියාව ලැබුණි.

මෙම අධ්‍යයනයෙන් පහත සඳහන් කරුණු අනාවරණය කර ගත හැකි විය.

එනම්,

- ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීමේ මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් ආකාරයට සියළුම පාසල් මිලදී ගැනීමේ ක්‍රියාවලියෙහි නිරත වන බව,
- ප්‍රාග්ධන නඩත්තු භාණ්ඩ හා උසස් තලයේ ව්‍යාපෘති සඳහා ලබා දෙන මුදල් භාවිත කිරීම නියැදියේ පාසල්වලට අසීරු බව,
- පාරිභෝජ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා පාසල්වලට ලබා දෙන මුදල් ප්‍රමාණවත් නොවන බව,
- ලබා ගත් ගුණාත්මක යෙදවුම් ප්‍රායෝගිකව පන්ති කාමරය තුළ භාවිතයට ගැනීම ඉතාම පහළ මට්ටමක පවතින බව,
- ගුණාත්මක යෙදවුම් ද්‍රව්‍ය භාවිතයට ගැනීම සඳහා ගුරුභවතුන් සතුව පවතින දැනුම ප්‍රමාණවත් නොවන බව,

මෙම ගැටළු අවම කර ගැනීමට විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ඉදිරිපත් කරන ලද යෝජනා විමර්ශනය කිරීමේ දී වඩාත් පැහැදිලි වූයේ රාජ්‍ය අධ්‍යාපනික අංශයේ මුදල් භාවිතයේ ඇති නාස්තිය අවම කිරීමට එම යෝජනා වඩාත් වැදගත් වන බවයි. මෙරට රජයේ පාසල් වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ලබාදෙන ගුණාත්මක යෙදවුම් ආශ්‍රිත ගැටළු අවම කිරීමටත්, ඒ ආශ්‍රිතව පවතින යහපත් තත්වයන් එලෙසින්ම පවත්වා ගනිමින් එම ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමටත් ඒ සම්බන්ධව කටයුතු කරන බලධාරීන්ට එම යෝජනා ඉවහල් වනු ඇත.

# Abstract

This is a study on purchasing and utiligation of quality inputs which are given to government schools to help the teaching - learning process. The quality inputs were introduced to the educational sector in 2002 under the Secondary Education moderation project. (SEMP) The aim of this was to improve the quality of teaching – learning process in the school system to equally distribute the quality inputs among the student in Sri Lanka. The purpose of this research was to find out whether these quality inputs are properly used in the teaching – learning process in schools.

The objectives of the study were,

01. To identify the procedure in purchasing Quality inputs in Schools.
02. To investigate how the quality inputs are used in schools.
03. To identify the difficulties in perchasing and usage of quality inputs in schools
04. To evolve sollutions for the problems in perchasing and usage of quality inputs in schools.

The sample consisted of eight schools in Galenbindunu wewa educational zone. Data were collected through questionnaires, conducting interviews, observations and obtaining information from documentary sources.

Based on the findings of the study, the following conclusions were made,

- Lower level of using quality inputs in the practical sessions in the classroom.
- Indentified the problems faced by the principals and the teachers when implementing this method.
- Learnt the actions taken by teachers and principals to Overcome those problems.
- No enough petty cash.
- No enough practice or training to use quality inputs in the classroom.